පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 222
ආයතනයේ නම : ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු
අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත
ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : *222*
நிறுவனத்தின் பெயர் : டிஜிட்டல் பொருளாதார அமைச்சு
பாராளுமன்றத்தின் அரசு கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட
அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் *119(4)* இன் கீழ்
கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக
எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 222
Name of the institution: Ministry of Digital Economy
Submission of observations of Hon. Minister and steps taken with
regard to the reports tabled by the Committee on Public Accounts in
terms of
Standing Order No. 119(4)

ආකෘතිය 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 222

ආයතනයේ නම :- ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

| අනු අංකය | නිරීක්ෂණය | නිරීක්ෂණය සඳහා පිළිතුරු / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | තොරතුරු තාක්ෂණ පද්ධතීන් භාවිතා කර රජයේ ආදායම වර්ධනය කර ගැනීම සඳහා වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අනු කමිටුව විසින් 2016.11.23 දින පාර්ලිමේන්තුවේ සභාගත කළ අතුරු වාර්තාවේ ඇතුළත් වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය. | රජයේ ඩිජිටල් ආර්ථික උපාය මාර්ගික අනුව විවිධ ආයතනවල පවතින පද්ධතීන් පුළුල් වැඩ පිළිවෙළක් යටතේ ඒකාබද්ධ කිරීම සඳහා ව්‍යාපෘතියක් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය මඟින් අනුමත කර ඇත. ජාතික දත්ත හුවමාරුව (National Data Exchange) ලෙස හඳුන්වන මෙම ව්‍යාපෘතිය යටතේ මධ්‍ය ගත වේදිකාවක් හරහා සියලුම දත්ත පද්ධති එකිනෙකට සම්බන්ධ කිරීමටත්, කාර්යක්ෂමතාවය වැඩි කිරීමටත් බලාපොරොත්තු වේ. එහිදී මූලික වශයෙන් ආදායම් එකතු කිරීම සිදුකරන ආයතන පිළිබඳ ප්‍රමුඛතාවයන් ලබාදෙන අතර එම ආයතන වල පවතින පද්ධතීන්ගේ වාසි මෙම දියුණු කර ඩිජිටල් කවය ඔස්සේ ආදායම් එකතු කිරීම වර්ධනය කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය 2026 වසරේ දෙවන කාර්තුව පමණ වන විට ප්‍රධාන ආදායම් එකතු කරන ආයතන ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |
| 02. | රජයේ ආයතනවල දත්ත පද්ධතීන් ඒකාබද්ධ කිරීමට යොදාගන්නා ඩිජිටල් ජාතික හැඳුනුම්පත කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් මේ වන විටත් රාජ්‍ය ආයතන 15ක් සහ අර්ධ රාජ්‍ය, මූල්‍ය හා පෞද්ගලික ආයතන 89ක් වෙත දෙපාර්තමේන්තු දත්ත හුවමාරු කිරීම සිදු කරයි. |

| | | |
|---|---|---|
| | | එසේම, බාහිර රාජ්‍ය ආයතන 03ක දත්ත හුවමාරු පහසුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් එහි කාර්යයන් උදෙසා ලබා ගෙන ඇත. (රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව, මැතිවරණ කොමිෂන් සභාව)<br><br>එසේම e-NIC හා SLUDI යන ව්‍යාපෘති දෙකම වෙනුවට 2026 ජනවාරි සිට ඉදිරියට තනි ව්‍යාපෘතියක් ලෙස ඉන්දීය ආධාර මුදල් ප්‍රශස්ත ලෙස උපයෝගී කරගෙන රජයේ සමස්ත ඩිජිටල් ආර්ථික උපායමාර්ගය යටතේ පුරවැසි හැඳුනුමකින් ඔබ්බට ගිය පුළුල් වපසරියක් වෙනුවෙන් ඉදිරි කාර්යයන් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති පසුබිමක ඒ සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කරමින් පවතී.<br><br>2025 අප්‍රේල් මාසයේ දී ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර SLUDI සඳහා වූ අවබෝධතා ගිවිසුමෙහි නිල යාවත්කාලීන කිරීම සිදු කර, ඒකාබද්ධ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව ස්ථාපනය කර ඇති අතර, පු.ලි.දෙ.කොමසාරිස් ජනරාල් එහි නිත්‍ය සාමාජිකයකු බැවින් DPI කළමණාකරණය හා මධ්‍යගත දත්ත හුවමාරුව හා දත්ත ආරක්ෂණ නීති ඇතුළත් නව තාක්ෂණික/ නෛතික පරිසරය තුළ රජයේ ආයතනවල දත්ත පද්ධතීන් ඒකාබද්ධ කිරීමට ඩිජිටල් හැඳුනුම්පත යොදාගැනීමේ ප්‍රායෝගික භාවිතය ප්‍රශස්ත කළ හැකි වේ. |
| 03. | රජයේ ආයතන ඩිජිටල්කරණය කළ විට ඒකාබද්ධ දත්ත පද්ධතීන් පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත් රජයේ තොරතුරු තාක්ෂණ සේවයේ ඇති වැටුප් ව්‍යුහය සමඟ ආකර්ෂණය කර ගැනීමට අපහසු බව කාරක සභාව හමුවේ දී අනාවරණය විය. | මෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් වඩා පුළුල් වැඩපිළිවෙලක් යටතේ නව රජයේ ඩිජිටල් ආර්ථික උපාය මාර්ගික සැලසුම අනුව සියළුම අංශ ආවරණය වන රාජ්‍ය ඩිජිටල් යටිතල පහසුකම් (Digital Public Infrastructure - DPI) වැඩසටහනක් ක්‍රියාත්මක |

| | | |
|---|---|---|
| | | කිරීම ආරම්භ කර ඇත. මෙම වැඩසටහන ගැන රජයේ සියලුම අංශ දැනුවත් කිරීම ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය මගින් සිදුකරමින් පවතී. ඒ යටතේ මෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගය ගැනීම සිදුකරනු ලැබේ. |
| 04. | ඒ ආයතනවල දත්ත පද්ධතීන් සම්බන්ධ කර නිර්මාණය කිරීමට අපේක්ෂා කරනු ලබන සම්මතිද රාජ්‍ය සංකල්පය (Connected Government) | සම්බන්ධිත රාජ්‍ය (Connected Government) නිර්මාණය කිරීම සඳහා නව රජයේ ඩිජිටල් ආර්ථික උපාය මාර්ගයේ මූලිකම කාර්යයකි. ඒ සඳහා රජයේ ඩිජිටල් යටිතල පහසුකම සංවර්ධනය කිරීම යටතේ ලංකා රාජ්‍ය ජාලය, ලංකා රාජ්‍ය මේඝය, ශ්‍රී ලංකා ජාතික අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත, ජාතික දත්ත හුවමාරුව යන ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. මෙම ව්‍යාපෘති මඟින් ලබා දෙන පහසුකම වන සියලුම රාජ්‍ය ආයතන වල දත්ත පද්ධති ජාතික දත්ත හුවමාරුව මගින් සම්බන්ධ කිරීම සිදු කිරීම කරනු ලබයි. මෙම ව්‍යාපෘති වල වැඩකටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව තාක්ෂණ හා ණය පහසුකම් ලබාදීමට එකඟතාවය ප්‍රකාශ කර ඇත. |
| 05. | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත දත්ත මත පදනම්ව ඩිජිටල් වශයෙන් ලබා ගත හැකි දත්ත මිලියන 8.5ක් පමණ සහ ඩිජිටල් නොවන දත්ත මිලියන 16ක් පමණ ඇති අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය විසින් හඳුන්වා දුන් NIC Lookup වෙබ් සේවාව හරහා රාජ්‍ය ආයතන 15ක් සහ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන 89ක් සමඟ දෙපාර්තමේන්තුව එකී දත්ත හුවමාරු කරන අතර API (Application Programing Interface) සේවාව හරහා රාජ්‍ය ආයතන 02ක් සහ අර්ධ රාජ්‍ය, මූල්‍ය හා පෞද්ගලික ආයතන |

| | | |
|---|---|---|
| | | 12 ක් සමඟ ද දෙපාර්තමේන්තුව ඉහත කී දත්ත හුවමාරුව සිදු කරයි.<br><br>පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සර්ට් ආයතනයේ ව්‍යාපෘතියක් වන ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයට (NCSOC) ඇතුළත් විය යුතු තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් ආශ්‍රිත රාජ්‍ය ආයතනයක් ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති බැවින් එම දෙපාර්තමේන්තුවේ සියළු ඩිජිටල් සේවා සඳහා අවශ්‍ය ආරක්ෂණයට වැඩි අවධානයක් ලැබේ. |
| 06. | කාරක සභාවේ නිරීක්ෂණ | දත්ත පද්ධතීන් ඒකාබද්ධ කිරීමේදී පොදු සංකේත ලෙස ජාතික හැඳුනුම්පත් අංකය, බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය හා විදේශිකයින් සඳහා විදේශ ගමන් බලපත්‍ර අංකය ඇතුළත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් සහිතව චක්‍රලේඛයක් දැනටමත් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත. අනෙකුත් කාරණා සම්බන්ධයෙන් ද නව රජයේ ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය අනුව ක්‍රියාමාර්ග ගැනීම සිදුකරමින් පවතී. ඒ යටතේ රාජ්‍ය ඩිජිටල් යටිතල පහසුකම පිහිටුවීම මඟින් මෙහි සඳහන් කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුවන බව සඳහන් කළ හැක. |

වරුණ ශ්‍රී ධනපාල

ලේකම් (වැ.බ.)

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

2025.09. 24